# සංක්ෂිප්තය

මෙම අධ්‍යයනයේ ඉලක්කය වූයේ ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල සේවයේ නියුතු විදුහල්පතිවරුන්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා පිළිබඳ විමර්ශනය කිරීම විය.

විදුහල්පතිවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා පවතින අවස්ථා සොයාබැලීම, විදුහල්පතිවරුන්ගේ වෘත්තිය සංවර්ධන අවශ්‍යතා හඳුනාගන්නා ආකාරය විමර්ශනය කිරීම, ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල විදුහල්පතිවරුන් තෝරාපත් කරගන්නා ආකාරය සොයා බැලීම, විදුහල්පති පුහුණු කිරීමේ ක්‍රමවේදයන් සහ ගුනදොස් සොයා බැලීම, රජයේ පාසල්වල විදුහල්පතිවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ඵලදායී ක්‍රමවේදයන් නිර්ණය කිරීම අධ්‍යයනයේ අරමුණු විය.

කොළඹ අධ්‍යාපන කලාපයේ පිහිටි සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු මෙහෙයවන 1 AB හා 1C වර්ගයේ පාසල්වලට පමණක් මෙම අධ්‍යයනය සීමා විය. නියැදිය ලෙස එයින් පාසල් පහළොවක් තෝරාගනු ලැබීය. මෙම අධ්‍යයනය සඳහා නියැදි සමීක්ෂණ පර්යේෂණ ප්‍රවේශය උපයෝගී කරගන්නා ලදි. තොරතුරු ලබාගැනීමට නියැදියට අයත් පාසල්වල සේවය කරන විදුහල්පතිවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන්, අංශ ප්‍රධානීන්, ගුරුවරුන්, විශ්වවිද්‍යාල පාඨමාලා සම්බන්ධීකාරකවරුන්, ජාතික අධ්‍යාපන ආයතනයේ පාඨමාලා සම්බන්ධීකාරකවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ස්ථරගත නියැදුම් ක්‍රමය භාවිතයෙන් තොරාගනු ලැබීය. සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි භාවිතයෙන් ඔවුන් වෙතින් තොරතුරු රැස් කරන ලදි.

රැස්කරන ලද දත්ත ප්‍රතිශත, වගු, ප්‍රස්තාර සහ සරල සංඛ්‍යාන ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය හා අර්ථකථනය කරන ලදි.

මෙම අධ්‍යයනයේ අනාවරණ වශයෙන් විදුහල්පතිවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා පවතින අවස්ථා ප්‍රමාණවත් නොවන බවත්, පාසල් කළමනාකරණ ක්‍රියාවලියේදී විදුහල්පතිගේ කළමනාකරණ දුර්වලතා පවතින බවත්, පාසල්වල විදුහල්පතිවරුන් වශයෙන් පත්කිරීමට පෙර හා පසු දේශීය හා විදේශීය විධිමත් පුහුණුවක් ලබාදිය යුතු බවත් හෙළිදරව් විය. විදුහල්පතිවරුන්ට ලැබෙන වෘත්තීය සංවර්ධන අවස්ථා පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයකින් තොරව ලැබෙන බවත්, පාසලේ ප්‍රධාන කළමනාකරුවන විදුහල්පතිට කළමනාකරණ පුහුණුව අනිවාර්ය කළ යුතු බවත් හඳුනා ගැනිණි. විදුහල්පතිවරුන් තෝරාපත් කරගැනීමේදී අක්‍රමිකතා සිදුවන බවත්, විදුහල්පතිවරුන් සඳහාම ඉලක්ක වූ වෘත්තීය සංවර්ධන වැඩසටහන් විශ්වවිද්‍යාල මට්ටමින් ආරම්භ විය යුතු බවත්, වෘත්තීය සංවර්ධනයේදී ප්‍රායෝගික පුහුණු අවස්ථා වැඩි කළ යුතු බවත්, වෘත්තීය සංවර්ධන වැඩසටහන්වල විධිමත් ඇගයීමේ ක්‍රියාවලියක් තිබිය යුතු බවත් හඳුනාගන්නා ලදි.

විදුහල්පතිවරුන්ගේ කාර්ය සාධනය කෙරෙහි ප්‍රතිපෝෂණයක් ලබාදිය යුතු බවත්, විදුහල්පතිවරුන්ගේ වෘත්තීය සංවර්ධනය අඛණ්ඩව සිදු කළ යුතු බවත්, වෘත්තීය සංවර්ධන පාඨමාලා පවත්වන ආයතන විදුහල්පතිවරුන් සමග පවත්වන සම්බන්ධතාවය

ප්‍රමාණවත් නොවන බවත්, විදුහල්පතිවරුන්ට වෘත්තීය සංවර්ධනයට යොමු වීමට පවතින අභියෝග අතර ඒ සඳහා පෙළඹවීමක් නොමැතිවීම, පාඨමාලාවල ගුණාත්මකභාවය අඩු මට්ටමක පැවතීම, තමන්ට අවශ්‍ය ක්ෂේත්‍ර පුහුණුවීමට අවස්ථාව නොමැතිවීම, පුහුණු ආයතනවල පවත්නා අකාර්යක්ෂමතාව ආදිය ප්‍රබල සාධක ලෙස හඳුනා ගන්නා ලදී. විදුහල්පතිවරුන් වෘත්තිය සංවර්ධන පාඨමාලාවන් සඳහා යොමුවීමට අනාගතයේදී සිදුකළ යුතු වෙනස්කම් අතර කාලීන අවශ්‍යතා අනුව පුහුණු ආයතනවල පවතින විෂය මාලාව වෙනස්විය යුතු බවත්, කුසලතා සංවර්ධනයට වැඩි අවධානයක් යොමු කළ යුතු බවත්, පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කරන ආයතන විදුහල්පතිවරුන්ගේ අදහස් ලබාගත යුතු බවත්, විදුහල්පතිවරුන්ගේ වෘත්තිය සංවර්ධනය සිදුකළ යුතු ක්ෂේත්‍ර අතර මූල්‍ය සම්පත් කළමනාකරණය සහ මානව සම්පත් කළමනාකරණයට වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් අනාවරණය විය.

දැනුම වේගයෙන් වෙනස්වන සමාජයක ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල විදුහල්පතිවරුන්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා සැලකිය යුතු වෙනසකට භාජනය වී ඇත. එම වෘත්තීය සංවර්ධන අවශ්‍යතා පිළිබඳ කෙරෙන මෙම අධ්‍යයනයෙන් ලැබෙන අනාවරණ පාසල් කළමනාකරුවන් සම්බන්ධයෙන් තීරණ ගන්නා වූත් එයට සම්බන්ධ වූත් සියලු දෙනාටම ප්‍රයෝජනවත් වන බව නොඅනුමානය.